ශීර්ෂය - 314 - දකුණු පළාත් සභාව - 2021
---------------------------------------------

1. දැක්ම මෙහෙවර හා කාර්යභාරයන්
---------------------------------------

1.1 දැක්ම
------

භාවිතයෙන් අර්ථවත් කරන යහපාලනයක් තුළින් සෞභාග්‍යමත් දකුණු පළාතක්.

1.2 මෙහෙවර
-----------

දකුණු පළාත තුළ පවතින මානව, මූල්‍ය හා භෞතික සම්පත් කළමනාකරණ සංකල්පයන් මත කාර්යක්ෂමව සහ සඵලදායීව මෙහෙයවීම තුළින් පළාත තුළ ආර්ථික හා සමාජයීය සංවර්ධනය ඉහළ තලයකට ගෙන ඒම සහ ජාතික ආර්ථිකයට ඉහළ දායකත්වයක් ලබාදීම.

1.3 කාර්යභාරය
--------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යභාරය හා කර්තව්‍යයන් ඉටුකිරීම.

2. ගිණුම්
-------

2.1 මූල්‍ය ප්‍රකාශන
-----------------

මුළු ප්‍රතිපාදනය හා වියදම
-----------------------------

දකුණු පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ප්‍රතිපාදනය රු.මිලියන 40,614 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම රු.මිලියන 39,120 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

2021 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපාදන උපයෝජනය පිළිබඳ තොරතුරු

| වියදම් විෂයය | ශුද්ධ ප්‍රතිපාදනය | වියදම | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | % |
| පුනරාවර්තන | 36,096 | 36,096 | - | - |
| මූලධන | 4,518 | 3,024 | 1,494 | 33 |
| එකතුව | 40,614 | 39,120 | 1,494 | |

3. විගණන නිරීක්ෂණය

------------------------

ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන පළාත් සභාව විසින් පළාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයන් සිදුකර තිබුණි. පළාත් සභාවේ අරමුදල විගණනය කර ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.